PAFFREL

# -2023-
# සැප්තැම්බර් මස
# දේශපාලන විශ්ලේෂණය

## විධායක සාරාංශය

මාර්තු මස සිට දිගින් දිගටම කල් දැමුණු  පළාත් පාලන මැතිවරණය නොපැවැත්වීම පිළිබඳ වූ ආණ්ඩුවේ තීරණය සනාථ කරමින් එම මැතිවරණය පැවැත්වීම අවලංගු කරන ලදී. මෙය ඉදිරි මැතිවරණ හටද එම ඉරණමම අත්විය හැකි බවට පුරෝකථන පළකිරීමට හේතුවිය. කෙසේ වෙතත්, ලබන වසරේ සැප්තැම්බර් මාසයේ පැවැත්වීමට නියමිත ජනාධිපතිවරණය සඳහා රජය  තාවකාලික අයවැයෙන් රුපියල් බිලියන 11 ක් වෙන් කර ඇත. ඒ සමගම දේශපාලන අදහස් දැක්වීම් සහ මහජන විරෝධයට ඇති ඉඩකඩ පාලනය කිරීම රජයේ අභිලාශය බවට සංඥා කරමින්  ඒ සමගම දැඩි ආන්දෝලනාත්මක නීති දෙකක් ගෙන එන ලදී. ත්‍රස්ත විරෝධී පනත් කෙටුම්පත සහ මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතතාවය පිළිබඳ පනත් කෙටුම්පත යන මෙම නීතින් දෙකම ජනතාවගේ නිදහසට සහ නිවහල්බවට බරපතල ලෙස බලපාන අතර ඒවා බලාත්මක වීම මගින් ප්‍රජාතන්ත්‍රවාදය සහ නීතියේ ආධිපත්‍යය කෙරෙහි දැඩි බලපෑමක් ඇති කරනු ඇතැයි ජාතික හා ජාත්‍යන්තර වශයෙන් සමාජය පුළුල් ආස්ථානයක සිටින අතර එම යෝජිත නීතින්ආ ඉවත්රපී කරන ලෙස ඉල්කලා සිටියි. ආර්ථික වර්ධනය අඛණ්ඩව සෘණාත්මකව පැවතීමත්, මිල ගණන් අඛණ්ඩව ඉහළ යාමත් සමග, ආරක්ෂක නීති ශක්තිමත් කිරීමට එරෙහිව  විරෝධතා යළි ආරම්භ වීමේ අවධානමක් පවතී.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ දෙවන වාරිකය ලබා ගැනීමට රජය අසමත් වීම රටේ ආර්ථිකයේ පවතින අවිනිශ්චිත තත්ත්වය සම්බන්ධයෙන් ඇති කළ පූර්ව අනතුරු ඇඟවීමකි. පසුගිය කාර්තුවේ ආර්ථික වර්ධනය සියයට සෘණ තුනක් ලෙස පැවතීමත් සමග ෂඵ්‍ර පවසා ඇත්තේ ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රකෘතිය තවමත් සහතික කළ මට්ටමක නොමැති බවයි. විශේෂයෙන්ම රජයේ ආදායම් උත්පාදනයේ ඇති විය හැකි හිගයක් හේතුවෙන් අයවැය හිගය අවම කර ගැනීම සම්බන්ධයෙන් රජය තමන් වෙත ලබා දී ඇති ආර්ථික ඉලක්ක සපුරා ගෙන නොමැති බව ද එහි සඳහන් කර තිබේ. ෂඵ්‍ර හි සැපිරිය යුතු අවශ්‍යතාවයන් වන කොන්ත්‍රාත්තු සහ ප්‍රසම්පාදන පිළිබඳ තොරතුරු වෙබ් අඩවියේ පළ කිරීම, බදු විරාම  සහ ප්‍රතිලාභ ලබන්නන් පිළිබඳ තොරතුරු ලබා දීමට රජය අසමත් වීම ආර්ථික ප්‍රතිසංස්කරණ සඳහා රජයේ කැපවීම පිළිබඳ විශ්වාසය නැති වීමට හේතු වී ඇත. කෙසේ වෙතත්, දූෂණ විරෝධී පනත ක්‍රියාත්මක කිරීමට කාලයක් ගතවනු ඇත. දූෂණ විරෝධී නීතිය සම්මත කිරීමේ අපේක්ෂිත ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීම සඳහා අමතර වසරක් අවශ්‍ය වන බව ජනාධිපතිවරයා පවසා ඇති අතර, එහි අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා  ආසන්න වශයෙන් වසර දෙකක කාලයක් ගතවනු ඇත.

රාජ්‍ය නොවන අංශයන්ගේ වර්තමාන වර්ධනයන් පිළිබඳ විග්‍රහ කරමින්න, පැෆ්රල් ඇතුළු සිවිල් සමාජ සංවිධාන එකතුවක් විසින් නිෂ්පාදනය කරන ලද සිවිල් සමාජ පාලනය පිළිබඳ විශ්ලේෂණාත්මක වාර්තාවේ සඳහන් වන්නේ "වර්තමානයේ වර්ධනය වන ආර්ථික අසාධාරණය පිළිබඳ හැඟීම ආර්ථික නිර්මාපකයින් විසින් උත්සන්න කර ඇති බවයි." මෙම ආර්ථික ප්‍රතිව්‍යුහ ගතකරණයේ පීඩනය අසමානුපතික ලෙස සමාජයේ සිටින දිළිඳුම පිරිස මත පටවා ඇති බවට පොදු අදහසයි. සිවිල් සමාජ පාලනය පිළිබඳ විශ්ලේෂණ

වාර්තාව සඳහා විශාල දායකත්වයක් ලබා දුන් ඩැරසඩ් සෑටිරජය හි ආචාර්ය නිශාන් ද මෙල් ද පෙන්වා දී ඇත්තේ වගකීමක් නොමැතිකම නිසා රජයේ පාඩු සමාජගත කරමින් ලාභය පුද්ගලීකරණය කරමින් සිටින බවයි.

ජනවාර්ගික සහ ආගමික වශයෙන් සංවේදී ගැටළු රාජ්‍ය බලධාරීන් විසින් නොසලකා හැර කටයුතු කරන බව අධිකරණය විසින් ලබා දුන් තීන්දුවලින් දිගින් දිගටම සංකේතවත් වුයේ නීතියේ ආධිපත්‍ය සහ මානව හිමිකම් ආරක්ෂණය දුර්වල මට්ටමක පවතින බවයි.

එම අධිකරණ තීන්දු සහ තීරණ පිළිබඳව පාර්ලිමේන්තුවේදී සහ ඉන් පිටතදී අපහාසාත්මක ප්‍රකාශයන්ට ලක්ව ඇත. ආන්දෝලනාත්මක කුරුඳුමලේ (කුරුන්ඩි විහාරය) නඩුවේ තීන්දුව දුන් මුලතිව් දිසා විනිසුරු සරවනරාජා ධූරයෙන් ඉල්ලා අස්වූවා පමණක් නොව ශ්‍රී ලංකාවෙන් පලා ගියේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පාර්ලිමේන්තු වරප්‍රසාද පාවිච්චි කරමින් අධිකරණය නම් කිරීම ඇතුළුව විවෘතව අධිකරණය විවේචනය කිරීම නිසා එල්ල වූ තර්ජන සහ බලපෑම් හේතුවෙනි. එක්සත් රාජධානියේ චැනල් 4 නාලිකාව විකාශය කළ වාර්තා චිත්‍රපටය මගින් 2019 අප්‍රේල් පාස්කු බෝම්බ ප්‍රහාරය යළි විවෘත කිරීම ජාතික විමර්ශනයේ සහ සත්‍ය සෙවීමේ ක්‍රියාවලියේ විශ්වසනීයත්වය පෙරට ගෙන ඇත. රජය එම චෝදනා ප්‍රතික්ෂේප කර ඇති අතර සත්‍ය සෙවීමේ ක්‍රියාවලියට ජාත්‍යන්තර මැදිහත්වීමේ අවශ්‍යතාවයද ප්‍රතික්ෂේප කර ඇත. ජාත්‍යන්තර මැදිහත්වීම සඳහා ආණ්ඩුවේ ආරක්ෂක ප්‍රවේශය සහ දේශීය පරීක්ෂණවල නැවත නැවතත් අසාර්ථක වීමත් වගකිව යුත්තන් නොමැති වීමත් නිසා ජාතික ප්‍රතිසන්ධාන යාන්ත්‍රණවල විශ්වසනීයත්වය පළුදු වී ඇත.
ඉදිරි මැතිවරණය පිළිබඳ ප්‍රශ්නය

ඉතා අඩු ආදායම් මට්ටටමක් සහ ඔරොත්තු දීමේ හැකියාව ඉතා අඩු මට්ටමක පවතින මේ මොහොතේ ආර්ථික ප්‍රකෘතිමත් කිරීම, ආර්ථික වර්ධනය සහ ස්ථාවරභාවයට යන ගමන් මගෙන් රට බැහැර කොට මැතවරණ පැවැත්වීම කෙරෙහි අවධානය යොමු කළහොත් එය වර්තමානයේ පවතින තත්වයටත් වඩා දරුණු නැවුම් ආකාරයේ අර්බුදයකට රට ගොදුරු වනු ඇතැයි හිටපු මහ බැංකු අධිපති ඉන්ද්‍රජිත් කුමාරස්වාමි ප්‍රකාශ කළ බව පුලුල්ව වාර්තා විය. රට මේ වනවිට සිදු කරගෙන යන ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩසටහන් යටතේ ලබා ඇති ප්‍රගතිය ආපසු හැරවීමට ශ්‍රී ලංකාවේ මැතිවරණ දින දර්ශනය ඓතිහාසිකව හේතුවක් වනු ඇති බව ඔහු පෙන්වා දුන්නේය. ආණ්ඩුවේ සාමාජිකයින්ගේ ප්‍රකාශවලින්ද පෙනී යන්නේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩපිළිවෙල ආරක්ෂා කිරීම සඳහා මැතිවරණ අත්හිටුවීමක් අවශ්‍ය වන බවයි. ආර්ථිකය වෙනුවෙන් පෙනීසිටින බව පෙන්වමින් මෙම මාර්ගය ගැනීමට රජය කැමැත්තෙන් සිටින බව පෙනී යයි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ඇතිකරගත් ගිවිසුමට පෙර සිටම මැතිවරණ පැවැත්වීමට වඩා ආර්ථික ප්‍රකෘතිමත් වීම කෙරෙහි අවධානය යොමු කළ යුතු බව පවසමින් ආණ්ඩුව මේ වසරේ මාර්තු මස පැවැත්වීමට නියමිතව තිබූ පළාත් පාලන මැතිවරණය කල් දැමුවේය.

කෙසේ වෙතත්, ලබන වසරේ සැප්තැම්බර් මාසයේ පැවැත්වීමට නියමිත ජනාධිපතිවරණය සඳහා රජය ලබන වසර සඳහා වන තාවකාලික අයවැයෙන් රුපියල් බිලියන 11 ක් වෙන් කර ඇත. එය එම මැතිවරණය පැවැත්වීමට රජය අදහස් කරන බවට සාධනීය ඉඟියකි. 2024 සඳහා තාවකාලික අයවැය රුපියල් බිලියන 3860 ක් වන අතර එයින් රුපියල් බිලියන 11 ක් කුඩා කොටසක් බව පෙනේ. කෙසේ වෙතත්, 2023 අයවැය රුපියල් බිලියන 3657 ක් වූ අතර, පළාත් පාලන මැතිවරණය සඳහා රුපියල් බිලියන 10 ක් අවශ්‍ය වූ අතර එය එම අයවැයෙන්ද සුළු කොටසක් පමණි. නමුත් එම මැතිවරණය නොපවත්වන ලද අතර ආණ්ඩුව තර්ක කළේ මෙම මුදල් මැතිවරණවලට වඩා වැදගත් සංවර්ධන අවශ්‍යතා සඳහා වියදම් කළ බවයි. ඊට අමතරව මැතිවරණ කල් දැමීම නිසා පළාත් පාලන මැතිවරණයට නාමයෝජනා භාර දුන් අය දැඩි දුෂ්කරතාවලට මුහුණ දී ඇති බැවින් පළාත් පාලන මැතිවරණය සඳහා ඉදිරිපත් කළ නාමයෝජනා අවලංගු කිරීමට රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශ උපදේශක කමිටුවක් ඒකමතිකව තීරණය කිරීමත් සමඟ පළාත් පාලන මැතිවරණය දැන් අවලංගු කර ඇත.

විශේෂයෙන් රටේ පවතින ආර්ථික අර්බුදය හමුවේ රජය ගත් තීරණය සම්බන්ධයෙන් කණස්සල්ල පළ කරන බව පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා පැවසීය. හෙට්ටිආරච්චි මහතා ප්‍රශ්න කළේ එවැනි තීරණයක් ගැනීම නිසා සිදුවන මූල්‍ය පාඩුවට වගකියන්නේ කවුරුන්ද යන්නයි. පවතින තත්ත්වය හමුවේ වුවද පළාත් පාලන මැතිවරණය කඩිනමින් පැවැත්වීමේ වැදගත්කම ඔහු අවධාරණය කළේය. තවද, 2023 පළාත් පාලන මැතිවරණයට සූදානම් වීම සඳහා ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව දැනටමත් සැලකිය යුතු මුදලක් ආයෝජනය කර ඇති බව හෙට්ටිආරච්චි මහතා අවධාරණය කළේය.

එබැවින් නාමයෝජනා අවලංගු කිරීම නිසා ඇති විය හැකි ආදායම් අහිමිවීමට බලපානවා පමණක් නොව මැතිවරණය සඳහා දැනටමත් වෙන් කර ඇති සම්පත් ද  ඒ හේතුවෙන් අපතේ යයි. පළාත් පාලන මැතිවරණය සඳහා ඉදිරිපත් කළ නාමයෝජනා අවලංගු කිරීමට ඒකමතිකව ගත් තීරණය නිසා රුපියල් බිලියනයකට අධික මූල්‍ය පාඩුවක් සිදුවිය හැකිය. පළාත් පාලන මැතිවරණය සඳහා ඇස්තමේන්තුගත වියදම රුපියල් බිලියන 9.3 ක් පමණ වනු ඇතැයි මීට පෙර ගණන් බලා තිබුණි.

## ප්‍රජාතන්ත්‍රවිරෝධී නීතිය

දේශපාලන පක්ෂ, සිවිල් සමාජය සහ ජාත්‍යන්තර මානව හිමිකම් කණ්ඩායම්වල විරෝධතා නොතකා, රැස්වීමේ සහ ප්‍රකාශනයේ නිදහස සීමා කරන නීති ගෙන ඒමේ සැලසුම් සමඟ ඉදිරියට යාමට රජය අදිටන් කරගෙන සිටින බව පෙනේ. ත්‍රස්ත මර්දන පනත් කෙටුම්පත සහ මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පත ජනතාවගේ නිදහසට හා නිවහල්බවට බරපතල  ලෙස බලපාන බවත් එය රටේ ප්‍රජාතන්ත්‍රවාදයට සහ නීතියේ ආධිපත්‍යයට දැඩි බලපෑමක් එල්ල කරන  බවත් ඒවා ඉවත් කර ගන්නා ලෙසත් නීතිඥ සංගමය රජයෙන් ඉල්ලා සිටී. මේ නීති දෙක පාර්ලිමේන්තුවෙන් සම්මත වුවහොත් ආණ්ඩුව වැරදි මාර්ගයක ගමන් කරන විටකදී පවා එය අභියෝගයට ලක්කිරීම තවදුරත් අපහසු කාර්යක් වීමට ඉඩ ඇත.

ත්‍රස්තවාදය වැළක්වීමේ පනත ප්‍රතිස්ථාපනය කිරීමට අපේක්ෂා කරන ත්‍රස්ත විරෝධී පනත කෙටුම්පත පුළුල් විෂය පථයකින් යුක්ත වන අතර එමගින්ම හජන විරෝධතා හෝ වෘත්තීය ක්‍රියාමාර්ගවල නිරත වන පුද්ගලයින් අත්අඩංගුවට ගැනීමේ බලය රජයට ලබා දී ඇත. "මහජනයා බිය ගැන්වීම හෝ මහජනයාගෙන් කොටසක් බිය ගැන්වීම" යැයි චෝදනා ලබන අය මෙම නීතිය යටතේ අත්අඩංගුවට ගත හැකිය. පනත් කෙටුම්පතේ 3 වැනි වගන්තියේ සීමාවකින් තොරව ත්‍රස්තවාදය ලිහිල් ලෙස අර්ථ දක්වා ඇත. දැනට ක්‍රියාත්මක වන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ 2 වන වගන්තිය, දණ්ඩ නීති සංග්‍රහයේ ඇති වැරදිවලට එරෙහිව සීමා කර ඇති වැරදි එනම් පනතේ ලැයිස්තුගත කර ඇති 'නිශ්චිත පුද්ගලයින්' සහ 'සාක්ෂිකරුවන්' මරණයට පත් කිරීම, පහර දීම හෝ සාපරාධී බිය ගැන්වීම් දක්වා සීමා කර ඇත. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ; සාක්ෂිකරුවන් පැහැර ගැනීම හෝ  රාජ්‍ය දේපළ මංකොල්ලකෑම හෝ අකටයුතුකම්, අවි හෝ උණ්ඩ නීතිවිරෝධී ලෙස ආනයනය කිරීම, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතට ඇතුලත්වන වැරදිකරුවන්ට රැකවරණය සැපයීම යනාදිය ඇතුලත් වේ.  3(1) වගන්තියේ ත්‍රස්ත විරෝධී පනත් කෙටුම්පත කිසිදු "නීති විරෝධී" ක්‍රියාවකට ත්‍රස්තවාදයී සීමා කර නැත. නොපැහැදිලි ලෙස "ඕනෑම ක්‍රියාවක්" හෝ "නීති විරෝධී අතපසු කිරීම්" දක්වා එය විහිදේ. තවද, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ මෙන් නොව, ත්පරස්නත විරෝධී පනත් කෙටුම්පතේ 3(1)() වගන්තිය අතිශයින් පුළුල් වන අතර, "ඕනෑම නිශ්චිත පුද්ගලයෙකුගේ හෝ සාක්ෂිකරුවෙකු හට සිදු කරන සාපරාධී බිය ගැන්වීම" යන වාක්‍ය ඛණ්ඩය ඉවත් කර ඇති  ඒවෙනුවට "මහජනයා බිය ගැන්වීම" යන වාක්‍ය ඛණ්ඩය ඇතුලත්ප් කොට අනවශ්‍ය ලෙස සහ නොපැහැදිලි ලෙස පුළුල් අර්ථ දැක්වීමක් ගෙනවිත් තිබේ. උදාහරණයක් ලෙස පොහොර ඉල්ලා ගොවීන්ගේ නීත්‍යානුකූල විරෝධතා පාගමනක් අවසන් විය හැක්කේ විරෝධතා පාගමනේ නායකයින් 'මහජනයාගෙන්  කොටසක් බිය ගැන්වීම' සහ විරෝධතා පාගමනේදී නිර්වචනය නොකළ පුද්ගලයෙකුට 3(2) යටතේ "රිදවීම" සම්බන්ධයෙන් අත්අඩංගුවට ගැනීමෙනි.

එසේම මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ  පනත් කෙටුම්පතේ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසට හානිදායක වන වගන්තින්  අඩංගු වී ඇත. ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය (බ්ෂෂ), සහ එහි අනුබද්ධ සංවිධාන, යෝජිත මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පත පිළිබඳව සිය කනස්සල්ල පළ කර ඇති අතර, ජනාධිපතිවරයා විසින් සෘජුවම සාමාජිකයින් පත් කරනු ලබන ඉතා බලවත් මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය නියාමනය කිරීමේ කොමිසමක් පිහිටුවීමේ පියවරය කෙරෙහි එහිදී විශේෂ අවධානයක් යොමු කර ඇත. යෝජිත පනත් කෙටුම්පත "කරුණු ප්‍රකාශය" වැනි පුළුල් හා නොපැහැදිලි අර්ථ දැක්වීමකින් සමන්විත වන අතර එහි නිර්වචනය තීරණය කරන්නේ කවුරුන්ද යන්න අපැහැදිලිය. තවද, විධායකය විසින් පත් කරන ලද මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ  කොමිසමට නිවේදන නිකුත් කිරීමේ බලය සහ අසත්‍ය ප්‍රකාශ පැතිරීම නැවැත්වීමේ අධිකාරී බලය  ඇත. මෙය "අසත්‍ය ප්‍රකාශය" යන යෙදුම අනිසි ලෙස භාවිතා කිරීම සහ එහි අර්ථ නිරූපණය පිළිබඳ උත්සාහයන් මතු කරයි.  මෙම පනත මගින් මාධ්‍ය නිදහසට බලපෑ හැකි අන්දමින් හිරිහැර කිරීම් පිළිබඳ කරුණු ඇතුලත් ප්‍රවෘත්තීන් වාර්තා කිරීම යමෙකු බියවැද්දීමක් ලෙස සලකා එකී කරුණු සන්නිවේදනය  අපරාධ වරදක් බවට පත් කරයි.

## IMF ප්‍රමාදයට හේතුව ක්‍රියාත්මක නොවීමයි.

දෙවන වාරිකය ලබා දීම සම්බන්ධයෙන් නිශ්චිත කාලසීමාවක් නොමැති බව පවසන ෂෆ්‍ය පෙන්වා දෙන්නේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ශ්‍රී ලංකාව ලබාදුන් ඩොලර් බිලියන 3 ක ණය මුදලේ දෙවන වාරිකය ප්‍රමාද වීමට හේතුව වැඩසටහනේ අරමුණු සපුරා ගැනීමට රට අපොහොසත් වීම නිසා බවයි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ දෙවන වාරිකය ලබා ගැනීමට රජය අසමත් වීම ආර්ථිකයේ අවිනිශ්චිත තත්ත්වය සම්බන්ධයෙන් පූර්ව අනතුරු ඇඟවීමකි. ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රකෘතිය තවමත් සහතික වී නොමැති බව **IMF** පවසයි. විශේෂයෙන්ම රජයේ ආදායම් උත්පාදනයේ ඇති විය හැකි හිඟයක් හේතුවෙන් අයවැය හිඟය අවම කර ගැනීම සම්බන්ධයෙන් රජය තමන් වෙත ලබා දී ඇති ආර්ථික ඉලක්ක සපුරා ගෙන නොමැති බව ද එහි සඳහන් කර තිබේ. ෂෆ්‍ය හි සැපිරිය යුතු අවශ්‍යතාවයන් වන කොන්ත්‍රාත්තු සහ ප්‍රසම්පාදන පිළිබඳ තොරතුරු වෙබ් අඩවියේ පළ කිරීම, බදු විරාම සහ ප්‍රතිලාභ ලබන්නන් පිළිබඳ තොරතුරු ලබා දීමට රජය අසමත් වීම ආර්ථික ප්‍රතිසංස්කරණ සඳහා රජයේ කැපවීම පිළිබඳ විශ්වාසය නැති වීමට හේතු වී ඇත.

නිව්යෝර්ක් නුවර එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල සැසිවාරයට සමගාමීව **USAID** පරිපාලක සමන්තා පවර් හමුවූ ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා දූෂණයට එරෙහිව කටයුතු කිරීමට කාලයක් ගතවන බව තහවුරු කළේය. විධිමත් පුහුණුවක් සහිත කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීමේ ක්‍රියාවලිය සමඟ දූෂණ විරෝධී කොමිසම මේ වන විට පොරබදමින් සිටින බව ජනාධිපති වික්‍රමසිංහ මහතා සඳහන් කළේය. මෙම තත්ත්වය සැලකිල්ලට ගෙන, දූෂණ විරෝධී නීතිය සම්මත කර ගැනීමේ අපේක්ෂිත ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීම සඳහා අමතර වසරක් අවශ්‍ය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, දූෂණ විරෝධී ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා තම රජයේ සමස්ත රාජ්‍ය යාන්ත්‍රණය මුළුමනින්ම අනුගත කර ඇති බව ප්‍රකාශ කළ ජනාධිපතිතුමා එම කටයුතු කඩිනමින් නිම කිරීමට අවශ්‍ය සහය ලබාදෙන ලෙස ඉල්ලා සිටියේය.

විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා විසින් ශ්‍රී ලංකාවේ දේශීය ණය ප්‍රශස්ත කිරීමේ (**DDO**) ක්‍රියාවලියේ බරෙහි සාධාරණ කොටසක් දරන ලෙස පුද්ගලික ණය දෙන්නන්ගෙන් සහ සුපිරි ධනවතුන්ගෙන් ඉල්ලා සිටින ලදී. මෙම ධනවත් කණ්ඩායම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ බරින් ගලවා ගැනීම සඳහා ආණ්ඩුව විසින් එකී බර සම්පූර්ණයෙන්ම කම්කරු පන්තියේ උරහිස් මත තැබීමේ ආණ්ඩුවේ විනාශකාරී ප්‍රතිපත්තිය ඔහු විවේචනය කළේය. ආර්ථික වශයෙන් මෙන්ම මූල්‍ය අභියෝගවලට මුහුණ දීම සඳහා ජාතියේ සියලුම පාර්ශවකරුවන් දායක වීමේ අවශ්‍යතාව ඔහු අවධාරණය කළේය. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ රජය විසින් හඳුන්වා දුන් බදු කප්පාදුවලින් ව්‍යාපාරික අංශයට ප්‍රතිලාභ ලැබී ඇති බව ඔහු සඳහන් කළේය. එවැනි කප්පාදු කිරීම් හේතුවෙන් රජයට සියයට 8ත් 10ත් අතර සැලකිය යුතු ආදායම් පාඩුවක් සිදුව ඇති බව ප්‍රේමදාස මහතා පෙන්වා දුන්නේය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (**IMF**) නිර්දේශ අන්ධ ලෙස පිළිපැදීම ගැන ප්‍රේමදාස මහතා අදහස් පළකළ අතර, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ පැකේජය වඩාත් හිතකර විය යුතුව තිබූ බවත්, තමන් බලයට පත්වීමත් සමඟ ගිවිසුම නැවත සාකච්ඡා කරන බවත් ප්‍රකාශ කළේය.

**Verite Research** ආයතනය විසින් සිදු කරන ලද මහජන මත විමසුමකින් පෙන්නුම් කර ඇත්තේ **IMF** මගින් අනාගතයේදී ආර්ථිකය නරක අතට හැරෙනු ඇතැයි ශ්‍රී ලාංකිකයන්ගෙන් සියයට 45 ක් පමණ විශ්වාස කරන බවයි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ශ්‍රී ලංකාව ගෙන යන වැඩපිළිවෙල අනාගතයේ දී ශ්‍රී ලංකාවේ ආර්ථිකයට යහපතක් වනු ඇතැයි විශ්වාස කරන්නේ ජනගහනයෙන් සියයට 28 ක් පමණි. තම ආර්ථික තත්ත්වයන්ට මුහුණ දීමේදී මිනිසුන් මුහුණ දෙන දුෂ්කරතා විරෝධතා සහ උද්ඝෝෂණ ව්‍යාපාරවලට තුඩු දිය හැකිය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ එකඟ වූ ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩසටහනේ වියදමින් පවා ජනතාව මත ඇති ආර්ථික දුෂ්කරතා සමනය කිරීමට විවිධ දේශපාලන පක්ෂ තමන්ගේම පොරොන්දු දීම සමඟ තරඟකාරී මැතිවරණ දේශපාලනයේ තර්කනය ක්‍රියාත්මක වීමට ඉඩ ඇත.

සිවිල් සමාජ පාලනය පිළිබඳ විමර්ශනය

සිවිල් සමාජය පිළිබඳ තක්සේරුව දූෂණය සම්බන්ධයෙන් පමණක් නොව රජය විසින් සිදු කරනු ලබන ආර්ථික ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියට ආවේණික වූ අසමානතාවය සම්බන්ධයෙන් ද අඳුරු අපේක්ෂාවට අනුරූප වේ. ශ්‍රී ලංකාවේ දූෂණ විරෝධී සන්දර්භය පිළිබඳ සිවිල් සමාජ පාලනය පිළිබඳ විමර්ශනය පිළිබඳ වාර්තාවක් පැෆ්රල් ඇතුළු සිවිල් සමාජ සංවිධාන එකතුවක් විසින් සම්පාදනය කරන ලද අතර එය මහාචාර්ය අර්ජුන පරාක්‍රම විසින් රචනා කරන ලද අතර එහි සඳහන් වන්නේ "වර්තමානයේ වර්ධනය වන ආර්ථික අසාධාරණය පිළිබඳ හැඟීම වඩාත් තීව්‍ර කර ඇති බවයි. ආර්ථික අර්බුදයේ නිර්මාපකයින් විසින් යෝජිත

ප්‍රතිසංස්කරණයේ බරෙහි කිසිදු කොටසක් නොදරමින් ඒ වෙනුවට කිසිදු මහජන සංවාදයකින් තොරව එකී අර්බුදයේ වින්දිතයින් මතම නැවත නැවතත් බර පටවමින් සිටියි. මෙම විශ්ලේෂණ වාර්තාව ජාතියේ වත්මන් අර්බුදයට මූලික හේතු විසඳීම සඳහා නිර්මාණය කර ඇති පුළුල් පාලන ප්‍රතිසංස්කරණ නිර්දේශ මාලාවක් හඳුන්වා දෙන ලදී.

භූගෝලීය, වාර්ගික, ආගමික සහ සංස්කෘතික ආදී විවිධ අංශයන් කණ්ඩායම් නියෝජනය කරමින් සහභාගිවන්නන් 250 කට අධික සංඛ්‍යාවක් විසින් සපයන ලද තොරතුරුවලින් මෙම වාර්තාව පෝෂණය වී ඇත. මහාචාර්ය අර්ජුන පරාක්‍රම මහතා සිවිල් සමාජ මුලපිරීම සඳහා පර්යේෂණ සිදු කළේය. ශ්‍රී ලංකාව තුළ භාවිතා වන ඉහළ සම්භාවිතා සහ අධි අවදානම් උපක්‍රම අතර රටේ වගවීමේ රාමුව ව්‍යුහාත්මකව දුර්වල කිරීම, රාජ්‍ය නිලධාරීන්ට බලපෑම් සහ ඇඟිලි ගැසීම්, රාජ්‍ය ව්‍යවසාය අවභාවිත කිරීම, රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටි හැසිරවීම, සිවිල් සමාජය, සහ නීති විරෝධී මූල්‍ය ගනුදෙනු භාවිතය යටපත් කිරීම බව වාර්තාව අනාවරණය කරයි.

ශ්‍රී ලංකාවේ ප්‍රතිසංස්කරණවල තීරණාත්මක සමාජ-දේශපාලන සන්දර්භය පිළිබිඹු කරමින් මෙම සහයෝගීතා ප්‍රයත්නය මෙහෙයවනු ලැබුවේ ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා (**TISL**) ආයතනය, **Verité Research**, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (**CPA**), සර්වෝදය, ජනතා කේන්ද්‍රය, නිදහස් හා සාධාරණ මැතිවරණ සඳහා ක්‍රියාමාර්ගය (පැෆ්රල්) සහ ජාතික සාම කවුන්සිලය (**NPC**) යන ආයතනවලින් සමන්විත මූලික කණ්ඩායමක සහයෝගයෙනි. "ආර්ථික ප්‍රකෘතිය සඳහා දූෂණ විරෝධී ප්‍රතිසංස්කරණ පිළිබඳ සිවිල් සමාජ මුලපිරීම" පිහිටුවීමට ඔවුන් එක් වූයේ අපේ රට ගැඹුරට කිඳා බැස ඇති දූෂණයෙන් කිලිටු වූ පාලන අර්බුදයකට මුහුණ දී සිටින බවට සාමූහික අවබෝධයක් ඇතිවය. අප සත්‍ය වශයෙන්ම ප්‍රගතියක් ලබා ගැනීමට අදහස් කරන්නේ නම් අප මෙම ප්‍රශ්නයට අවධානය යොමු කිරීම අත්‍යවශ්‍ය වේ.' ශ්‍රී ලංකාව පිළිබඳ සිවිල් සමාජ පාලනය පිළිබඳ විමර්ශන වාර්තාවී සඳහා ඉහළ පෙළේ එළිදැක්වීමක් සැප්තැම්බර් 13 වැනි බදාදා කොළඹ ඊථෂකා හිදී සිදු විය. මෙම අවස්ථාවට ප්‍රතිපත්ති සම්පාදකයින්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (**IMF**) නියෝජිතයින්, රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල, ජාත්‍යන්තර අරමුදල් ආයතන, සිවිල් සමාජ සංවිධාන, විද්වතුන් සහ වෙනත් විවිධ ක්ෂේත්‍රවල සම්භාවනීය අමුත්තන්ගේ සහභාගීත්වය දක්නට ලැබුණි.

## පාස්කු බෝම්බ ප්‍රහාරය පිළිබඳ යළිත් සලකා බැලීම.

පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරය පිටුපස කතාව හෙළිදරව් කරන බව පවසන චැනල් 4 වාර්තා චිත්‍රපටය එළිදැක්වීමත් සමඟ එම අපරාධය පිටුපස සිටියේ කවුරුන්ද සහ ඇයිද යන්න පිළිබඳව රට තුළ යළි සංවාදයක් ආරම්භ වී තිබේ. ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා විශ්‍රාමලත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයෙකුගේ ප්‍රධානත්වයෙන් විමර්ශන කමිටුවක් පත් කළ අතර ප්‍රහාර පිටුපස මහ මොළකරුවෙකු සිටින බවට හිටපු නීතිපතිවරයාගේ චෝදනාව විමර්ශනය කිරීම සඳහා පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් පත් කිරීමට අදහස් කරන බව ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා ප්‍රකාශ කළේය. මෙම පරීක්ෂණ දෙක අවසන් වූ පසු එතැන් සිට ඉදිරියට යන ආකාරය පිළිබඳ අවසන් තීරණයක් ගැනීම සඳහා එම වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන බවද ජනාධිපතිවරයා පවසා තිබේ.

පාස්කු ඉරිදා සංහාරය සම්බන්ධයෙන් චැනල් ෆෝ නාලිකාව නගන චෝදනා විමර්ශනය කිරීම සඳහා ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා විසින් යෝජනා කරන ලද විශේෂ විමර්ශන කමිටුව කතෝලික සභාව ප්‍රතික්ෂේප කළේය. කතෝලික සභාවේ මාධ්‍ය ප්‍රකාශක ගරු සිරිල් ගාමිණී පියතුමන් ප්ථරකාශ කළේ මෙවැනි කමිටු මගින් සත්‍යය හෙළි කිරීමට හැකි වනු ඇතැයි කතෝලික සභාව විශ්වාස නොකරන බවත් කාලය හා මහජන මුදල් නාස්ති කරන ව්‍යායාමයක් වන බවයි. කොළඹදී මාධ්‍ය අමතමින් එතුමන්ප පැවසුවේ පසුගියදා චැනල් ෆෝ නාලිකාවේ වැඩසටහන සම්බන්ධයෙන් සභාව කරුණු හතරක යෝජනාවක් ඉදිරිපත් කළ බවයි. "පළමුවෙන්ම අපි ඉල්ලා සිටින්නේ චැනල් ෆෝ නාලිකාව විසින් හෙළිදරව් කරන ලද කරුණු මෙන්ම පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරය පිළිබඳ විමර්ශනවල සොයාගැනීම් මත පදනම්ව අපක්ෂපාතී, ස්වාධීන සහ විනිවිදභාවයෙන් යුත් පරීක්ෂණයක් වහාම ආරම්භ කරන ලෙසයි. දෙවනුව, එවැනි පරීක්ෂණ ස්වාධීන ජාත්‍යන්තර විශේෂඥ මණ්ඩලයක අධීක්ෂණය සහ නිරීක්ෂණ යටතේ සිදු කළ යුතුය. තෙවනුව, විනිවිදභාවය සහතික කරමින් පරීක්ෂණය පැවැත්වීම සඳහා ජාතික විශේෂඥ කණ්ඩායමක් ද පත් කළ යුතුය. හතරවනුව, පරීක්ෂණ අවසන් වනතුරු සියලුම බුද්ධි අංශ සහ උසස් පොලිස් නිලධාරීන්ගේ සේවය වහාම අත්හිටුවිය යුතුයි."

ජනාධිපති වික්‍රමසිංහගේ මෑත කාලීන යෝජනා, කලින් උත්සාහ කළ ක්‍රියාමාර්ගවලට සමාන වන අතර ඒවා සාර්ථක වී නැත. ප්‍රහාරවලට වගකිවයුත්තන් හඳුනාගෙන නීතිය ඉදිරියට පමුණුවා ගැනීමට අපොහොසත් වීම මෙන්ම පූර්ව ජාතික පරීක්ෂණ මගින් වගවීමක් නොමැතිකම ජාත්‍යන්තර පරීක්ෂණයක් සඳහා දිගින් දිගටම ඉල්ලීම් කිරීමට හේතු වී තිබේ. මෙම විමර්ශන ප්‍රධාන වශයෙන් මෙහෙයවනු ලබන්නේ කාදිනල් මැල්කම් රංජිත් හිමිපාණන්ගේ නායකත්වයෙන් යුත් කතෝලික සභාව සහ වින්දිතයන්ගේ පවුල් විසිනි. චැනල් 4 හෙළිදරව් කිරීම්වලට ප්‍රතිචාර දක්වමින් විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස ද ජාත්‍යන්තර සහයෝගය ඇතිව පරීක්ෂණ පැවැත්විය යුතු බව ප්‍රකාශ කළේය. පාස්කු ප්‍රහාරය සැබවින්ම ත්‍රස්තවාදී ක්‍රියාද නැතිනම් බලය අල්ලා ගැනීමේ උපක්‍රමශීලී ක්‍රියාවක්ද යන්න අවසාන වශයෙන් තීරණය කරන සැකයන් දුරු කිරීම සඳහා විශ්වසනීය පරීක්ෂණයක අවශ්‍යතාවය ඔහු අවධාරණය කළේය.

## අධිකරණයට අවමන් කිරීම

මුලතිව් දිසා විනිසුරු සහ මහේස්ත්‍රාත්වරයා ලෙස කටයුතු කළ සහ මතභේදාත්මක කුරුන්දිමලේ විහාරයේ නඩුවේ මුලසුන දැරූ ටී.සරවනරාජා හදිසියේ ඉල්ලා අස්වීම සම්බන්ධයෙන් නීති ප්‍රජාව තුළ පුළුල් විරෝධයක් ඇති වී තිබේ. තමා ඉල්ලා අස්වීමට මූලික හේතුව ලෙස විනිසුරු සරවනරාජා සඳහන් කළේ මරණ තර්ජන එල්ලවීමයි. තමාට එල්ල වී ඇතැයි කියන තර්ජන සම්බන්ධයෙන් පොලිසියට හෝ අධිකරණ සේවා කොමිෂන් සභාවට නිල වශයෙන් දැනුම් දීමකින් තොරව ඔහු ඉල්ලා අස් වූ බව අනාවරණය වීමත් සමඟ කනස්සල්ලට පත් විය. 2023 සැප්තැම්බර් 23 දිනැති ලිපියක් මගින් අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත යොමු කරන ලද ලිපියක් මගින් සරවනරාජා දිස්ත්‍රික් විනිසුරු, මහේස්ත්‍රාත්, පවුල් අධිකරණ විනිසුරු, ප්‍රාථමික අධිකරණ විනිසුරු, කුඩා හිමිකම් උසාවියේ විනිසුරු සහ බාලවයස්කරුවන් සම්බන්ධයෙන් වන අධිකරණය ඇතුළු විවිධ අධිකරණ භූමිකාවන්ගෙන් ඉල්ලා අස්වීමට තීරණය කරන ලදී. ඔහු රටින් පිටව ගොස් ඉන්දියාවට යන්නට ඇති බවට සමාජ මාධ්‍ය සහ අන්තර්ජාල වේදිකා ඔස්සේ වාර්තා පළවෙමින් තිබේ. කුරුන්දිමලේ විහාරස්ථානයේ සිද්ධියට අදාළව මරණීය තර්ජන එල්ලවීම සම්බන්ධයෙන් ඔහු වෙබ් මාධ්‍යවේදීන් දැනුවත් කළ බවටද තොරතුරු වාර්තාවේ.

කනගාටුවට කරුණක් නම්, මැතිවරණ ක්‍රියාවලියට අදාළ අධිකරණ තීන්දු ප්‍රශ්න කිරීමට ආණ්ඩුවේ සාමාජිකයින් වැඩි නැඹුරුවක් දැක්වීම අනෙකුත් ක්ෂේත්‍රවල අයහපත් ප්‍රතිවිපාක ඇති කරයි. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් තමන්ට හිමි පාර්ලිමේන්තු වරප්‍රසාද ප්‍රයෝජනයට ගනිමින් අධිකරණය ප්‍රසිද්ධියේ විවේචනය කරමින් එක් එක් විනිසුරුවරුන් නම් කිරීමට පවා කටයුතු කරමින් සිටිති. පාර්ලිමේන්තු වරප්‍රසාදයේ පරමාර්ථය වන්නේ ජාතික අවශ්‍යතා වෙනුවෙන් සත්‍ය හෙළි කිරීමට මහජනතාව විසින් තේරී පත් වූ නියෝජිතයන් බලගැන්වීමයි. කෙසේ වෙතත්, මෙම බලය විචක්ෂණශීලීව සහ සුපරීක්ෂාකාරීව භාවිතා කළ යුතුය. විශේෂයෙන්ම එය පුද්ගලයන් අපකීර්තියට හෝ අපහාස කිරීමට භාවිතා කරන විට. පාර්ලිමේන්තු වරප්‍රසාදවල ආරක්ෂාව භුක්ති විඳින අය එහි සැලකිය යුතු බලපෑම හඳුනාගෙන එය මධ්‍යස්ථව භාවිතා කළ යුතුය. මෙම වරප්‍රසාදය වැරදි ලෙස භාවිතා කිරීම එහි කීර්ති නාමයට කැළලක් වන අතර එය ඉටු කරන අත්‍යවශ්‍ය කාර්යභාරය පිළිබඳ පුළුල් අවබෝධය දුර්වල කරයි.

ඇතැම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ අගෞරවනීය හැසිරීම වාර්ගික හා ආගමික ගැටුම් සම්බන්ධ ආන්දෝලනාත්මක නඩුවලට මුලසුන හොබවන විනිසුරුවරයකු ඉල්ලා අස්වී රට හැර යාමට පවා තීරණය කරන තැනට වර්ධනය වී තිබේ. මෙම නඩු වලදී අධිකරණය විසින් නිකුත් කරන ලද පූර්වගාමී තීන්දු රජයේ බලධාරීන් නොසලකා හැර ඇති බව පෙනේ. අධිකරණ තීන්දු සහ තීන්දු පාර්ලිමේන්තුව තුළ මෙන්ම මහජන කතිකාවත තුළ ද අවමන් සහගත සහ පිළිකුල් සහගත ප්‍රකාශවලට ලක්ව ඇත. මතභේදාත්මක කුරුන්තුර්මලෙයි (කුරුන්ඩි විහාරය) නඩුවේ මුලසුන හොබවන මුලතිව් දිසා විනිසුරු සරවනරාජා ඉල්ලා අස්වූවා පමණක් නොව ශ්‍රී ලංකාවෙන් පිටව යාමට හේතුව ලෙස වාර්තාවන්නේ ඔහුට එල්ල වූ බලපෑම් සහ තර්ජන නිසාවෙනි. සමාජ මාධ්‍ය ඔස්සේ හුවමාරු වූ ලිපියකින් විනිසුරුවරයා අධිකරණ සේවා කොමිෂන් සභාවට දැනුම් දුන්නේ තමාට ජීවිත තර්ජන එල්ල වී ඇති බවයි. ප්‍රජාතන්ත්‍රවාදී රටක, විශේෂයෙන්ම රජය ඉක්මවා යාමෙන් තර්ජනයට ලක්ව ඇති පුද්ගලයන්ගේ අයිතිවාසිකම් සුරැකීමට අධිකරණය ඉල්ලා සිටින අවස්ථා වලදී අධිකරණයට පැනවෙන මෙවැනි බලපෑම් අවිවාදයෙන්ම පිළිගත නොහැකිය. නිවේදනයක් නිකුත් කරමින් ශ්‍රී ලංකා නීතිඥ සංගමය (BASL) අධිකරණයේ සාමාජිකයන්ට එරෙහි ඕනෑම ආකාරයක

තර්ජන හෝ ප්‍රචණ්ඩත්වය තරයේ හෙළා දකී. මුලතිව් මහේස්ත්‍රාත්වරයාගේ ඉල්ලා අස්වීම ශ්‍රී ලංකාවේ අධිකරණ නිලධාරීන්ගේ ආරක්ෂාව පිළිබඳ බරපතල කනස්සල්ලක් ඇති කළ හැකි බවට **BASL** අනතුරු අඟවා තිබේ. එබැවින් සිද්ධිය සම්බන්ධයෙන් පුළුල් හා අපක්ෂපාතී පරීක්ෂණයක් ආරම්භ කරන ලෙස ඊට රජයෙන් ඉල්ලා සිටී.

## ප්‍රතිසන්ධාන යාන්ත්‍රණයන් මතභේද ඇති කරලීම.

ප්‍රතිසන්ධාන කාර්යාලය නමින් නව රාජ්‍ය ආයතනයක් පිහිටුවීමට නියමිත වන  අතර, නඩු පැවරීමේ මුක්තිය සහ තෑගි වශයෙන් ලැබෙන දේශීය හා විදේශීය අරමුදල් රැස් කිරීමේ හැකියාව ඇතුළු පුළුල් පරාසයක බලතලවලින් එය සන්නද්ධ වනු ඇත. ජාතික සමගිය හා ප්‍රතිසන්ධානය සඳහා වන යෝජිත කාර්යාල පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේදී  සම්මත වුවහොත් එම කාර්යාලය ක්‍රියාත්මක වනු ඇත. රට තුළ ජාතික සමගිය, සංහිඳියාව සහ තිරසාර සාමය ඇති කිරීම සඳහා රජයට සහ අදාළ බලධාරීන්ට අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීමටත්, සංහිඳියාව සහ සහජීවනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සහ ජාතික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමටත් එය බලකර ඇත. කාර්යාලයට අනුයුක්තව සිටින ඕනෑම පුද්ගලයෙකුට වැරදි ලෙස විරුද්ධ වීම හෝ රාජකාරිය කිරීමට බාධා කිරීම හෝ කාර්යාලයට හිතාමතාම අසත්‍ය තොරතුරු ලබා දීම, පනත් කෙටුම්පතට අනුව කාර්යාලයේ අධිකාරියට අපහාස කිරීමේ වරදක් ලෙස සලකනු ලැබේ. සාමාජිකයින් එකොළොස් දෙනෙකුගෙන් යුත් මෙම කාර්යාලය අමාත්‍යාංශයක අතිරේක ලේකම්වරයෙකුගේ නිලයට නොඅඩු නිලතල දරන සාමාජිකයෙකුගෙන් සහ අමාත්‍යවරුන්ගේ නිර්දේශ මත තවත් දස දෙනෙකුගෙන් සමන්විත වේ. සියලුම සාමාජිකයින් ජනාධිපතිවරයා විසින් පත් කළ යුතු අතර, ඔවුන්ගෙන් එක් අයෙකු විෂය භාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත සභාපතිවරයා ලෙස නම් කරනු ලැබේ. සාමාජිකයින්ට අඛණ්ඩව වාර දෙකක් හෝ වෙනත් ආකාරයකින් සේවය කළ හැකි අතර, සෑම වාරයක්ම වසර තුනකට සීමා වේ.

ඇම්නෙස්ටි ඉන්ටර්නැෂනල් සහ හියුමන් රයිට්ස් වොච් (එච් ආර් ඩබ්ලිව්) ඇතුළු ජාත්‍යන්තර මානව හිමිකම් සංවිධාන නවයක් ජාතික සමගිය හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව සැලසුම් සහගතව නිර්මාණය කිරීම සම්බන්ධයෙන් සිය විවේචනය පළ කළහ. මෙම කොමිසම පසුගිය ගැටුම්වලට අදාළ උල්ලංඝනයන් විසඳීමට අදහස් කර ඇත. "සත්‍ය කොමිසමක් සඳහා ශ්‍රී ලංකාවේ දෝෂ සහිත සැලසුම්" යන මැයෙන් සිදු කළ ඒකාබද්ධ ප්‍රකාශයක් මගින් මෙම සංවිධාන ගැටුම් සම්බන්ධ අපයෝජනයන්ට ගොදුරු වූවන් සහ ඒවායේ වින්දිතයින් විසින් මීට පෙර ප්‍රකාශ කරන ලද අය සමඟ සමපාත වන උත්සසහයන් ඉස්මතු කරන ලදී.  මෙම කොමිසම මගින්  එකී  කටයුතු ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය විශ්වාසය ගොඩනැගීමට හෝ ආරක්ෂිත වටපිටාවක් ස්ථාපිත කිරීමට සැබෑ උත්සාහයක් ගෙන නොමැති බව ඔවුහු අවධාරණය කළහ. විශේෂයෙන් විපතට පත් ප්‍රජාවන් සමඟ අර්ථවත් උපදේශන නොමැති බව ද ඔවුහු පෙන්වා දුන්හ. අසාර්ථක කොමිෂන් සභා ඉතිහාසය පිළිබඳව අවධාරණය කළ ඒකාබද්ධ ප්‍රකාශය ජාතික සමගිය හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව සඳහා රජය දැනට ඉදිරිපත් කර ඇති යෝජනා පිළිබඳව ද සැක පළ කළේය. පසුගිය කොමිෂන් සභාවල අසාර්ථකත්වය සැලකිල්ලට ගනිමින් මෙම නව කොමිසම සත්‍යය, යුක්තිය සහ වන්දි ලබා දීමට කැමැත්තෙන් සහ හැකියාවෙන් සිටීද යන්න ඔවුන්  ප්‍රශ්න කළහ.

**PAFFREL**

**16**, Byrde Place, Off Pamankada Rd, Colombo 06, Sri Lanka.

**TEL**: el: 011 2 558 570/1   Fax: 011 2 558 572

**FAX**: 11 2 558 572

**Email**: paffrel@sltnet.lk

www.paffrel.lk